CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# පශ්චාත් මැතිවරණ සමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම: දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ පලි ගැනීම අවසන් කිරීම

**2010 ජනවාරි 30 වන දා:** පසුගිය සතියේ පැවති ජනාධිපතිවරණය හා සම්බන්ධ වූ මෑත සිදුවීම් මාලාවක් මගින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ වත්මන් තත්ත්වය පිළිබඳව අතිශය බරපතල කනස්සල්ල දනවනසුළු තත්ත්වයන් ඉස්මතු කොට දක්වයි. මැතිවරණ ව්‍යාපාර කාලපරිච්ඡේදය, මැතිවරණය සහ එයට පසු එළැඹුණු ආසන්න කාලපරිච්ඡේදය තුළ පෙර නොවූ විරූ තරම් මට්ටමක වන, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය නොසලකා හැරීම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවුනු ප්‍රචණ්ඩත්වය සහ මහපරිමාණ රාජ්‍ය සම්පත් අයුතු උපයෝජනයන් සිදුවුවා පමණක් නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලය හා ප්‍රජාතාන්ත්‍රික වටිනාකම්වලට ගරුකිරීම සම්බන්ධ යෙන් වූ කණස්සල්ල දනවනසුළු පූර්වාදර්ශයන් ගණනාවක් නිර්මාණය වීමද සිදුවිය.

විදුලි සංදේශ නියාමන කොමිසමෙහි (TRC) හැසිරීම, රජයේ පාලනය යටතේ පවතින මාධ්‍ය ආයතනයන් හී අතිශය පක්ෂවාදීත්වය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (SLRC) හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (SLBC) සඳහා නිසි බලධරයකු පත් කොට පසුව එම පත්වීම ඉවත් කොට ගැනීම, මැතිවරණ කොමසාරිස්වරයාගේ බලාධිකාරය සහ උපදෙස් පමණක් නොව ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය පවා රජයේ ආයතනයන් (විශේෂයෙන්ම පොලීසිය) විසින් නොසළකා හැරිම වැනි සිදුවීම් මෙම කාලය තුළ දක්නට ලැබිණි. ඒවා පිළිබඳව වූ තම කණස්සල්ල විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ( CPA) මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ( CMEV) සහ අනෙක් සිවිල් සමාජ සංවිධානයන් විසින් මින් පෙර පල කොට තිබිණි.

කෙසේ වුවද, වඩාත් පුළුල් ලෙස ගත් කල මැතිවරණයෙහි කර්කෂ අවසානය හා එයින් පසුව ගත වූ ආසන්න කාලය සක්‍රීය ප්‍රශ්නයන් සහ සැලකිලිමත් වියයුතු කරුණු ගණනාවක්ම මතු කරයි. මින් පෙර මැතිවරණයන් හී පැවති කිසිසේත්ම ප්‍රශස්ථ නොවූ තත්ත්වයන් තිබියදී වුවද කිවයුතුව ඇත්තේ විපක්ෂයේ ප්‍රධාන තරඟකරු මැතිවරණ දින රාත්‍රියෙහි හෝටලයක සිටිද්දී හමුදාව විසින් වටලනු ලැබ සිටීම සහ ඉන් පසුව ද රාජ්‍ය අධිකාරීන් විසින් දිගින් දිගටම හිරිහැරයන්ට භාජන කරනු ලැබූ තත්ත්වයක් අප විසින් මින් පෙර දැක නොතිබුණු බවයි. රජය විසින් තම ක්‍රියාවන් සාධාරණීකරණය කිරීම සඳහා විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයා වන විශ්‍රාමලත් ජනරාල් සරත් ෆොන්සේකා මහතා වෙත එල්ල කරණු ලැබූ ප්‍රධාන චෝදනාවක් වුයේ ඔහු විසින් රාජ්‍ය බලය පැහැර ගැනීමේ කුමන්ත්‍රණයක් සිදුකිරීමට උත්සාහ කළ බව, ප්‍රමුඛ දේශපාලනඥයින් ඝාතනය කිරීමට හා සිරකොට තැබීමට බලාපොරොත්තු වූ බව, ඔහු විසින් හමුදාවෙන් පැනගියවුන් රැකවරණයේ තබාගත් බව සහ ඔහු විසින් රාජ්‍ය රහස් හෙළි කළ බව වැනි අපැහැදිලි, නිරවද්‍යභාවය තහවුරු කරනු නොලැබූ සහ පුළුල් ලෙස ගත් කල ඒත්තුගැන්වීමට අපහසු වන්නාවූ චෝදනාවන්ය. එවැනි ක්‍රියාවක් මෙහෙයවීම සම්බන්ධයෙන් යමෙකු සැකකිරීමට රජයට හේතු ඇත්නම් එයට දැක්විය යුතු නිසි ප්‍රතිචාරය විය යුත්තේ ඒ පිළිබඳව නීතියට අනුව ක්‍රියා කිරිම සඳහා නීතිය ක්‍රියාත්මක කිරිමේ අධිකාරීන් හට ඉඩ හැරීමයි. ජනරාල් ෆොන්සේකා මහතා සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලැබූ ආකාරය මගින් හැඟවෙන්නේ දේශපාලනිකව පීඩා කිරිමේ සහ පලිගැනීමේ හැඟීමක් පල කරන වෙනස් අභිප්‍රායයන් බව පෙනේ. අනවශ්‍ය සහ ද්වේශ සහගත වූ මෙම ක්‍රියා මාර්ග මගින් රටේ දේශපාලන පැවැත්ම හා පුරවැසියන් ගේ හොඳ හිත මෙන්ම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපයද අනතුරට පත් කෙරේ.

ඇතැම් දිස්ත්‍රික්කවල හඳුනාගතහැකි පාලක පක්ෂයේ ඉහළ පුද්ගලයින් විසින් විපක්ෂයේ ඡන්ද ගනන් කිරිමේ නියෝජිතයින් පලවාහැරීම ඇතුළු ඡන්ද ගනන් කිරිමේ ක්‍රියාදාමය හා සම්බන්ධ අක්‍රමිකතාවයන් පිළිබඳව ජනරාල් ෆොන්සේකා මහතා විසින් චෝදනා කරනු ලැබ ඇත. මෙබඳු කරුණු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කිරීමට අපේක්ෂකයකු ලෙස ඔහුට අයිතියක් ඇති අතර ඉන් පසු ඒවායේ නිරවද්‍යතාවය ඔප්පු කිරිම ඔහුගේ වගකීමක් වනු ඇත. නීතිය මගින් ස්ථාපිත කොට ඇති ක්‍රියා පටිපාටියට අනුව උසාවිය මගින් මෙම කරුණු නිරාකරණය කරුණු ලැබීමට ඉඩහැරීම වඩාත්ම සුදුසු ක්‍රමයයි. ජනාධිපතිවරයා සහ රජය විසින් ජයග්‍රහණයේදී තම උදාර ත්‍යාගශීලීත්වය පල කිරිම ප්‍රජාතන්ත්‍රවාදයේ යහපත පිණිස වනු ඇත. පුරවැසියන් ගෙන් 40% කගේ පමණ සහයෝගය ලැබුනු පරාජිත අපේක්ෂකයකු දිගින් දිගටම අපවාදයට සහ පීඩාවට පත් කිරීමෙන් වැළකීමද එසේම වනු ඇත.

මේ අතර මාධ්‍ය නිදහස හා මාධ්‍යවේදීන් ගේ ශාරීරික ආරක්ෂාව සම්බන්ධයෙන් ද අවදානම් තත්ත්වයක් උද්ගතව ඇත. පහරදීම්, අතුරුදහන්වීම්, ආරක්ෂක ලේකම්වරයා වැනි ජ්‍යෙෂ්ඨ

නිලධාරීන් විසින් කරනු ලැබූ වාචික තර්ජන, ප්‍රශ්න කිරීම් සහ අත්අඩංගුවට ගැනීම්, විදේශීය වාර්තාකරුවන් රටින් පිටුවහල් කිරීමට නියෝග කිරීම්, පුවත්පත්වලට සීල් තැබීම්, සහ නෛතික පදනමක් නැතිවා සේ පෙනෙන ප්‍රවෘත්ති වෙබ් අඩවි අවහිර කිරීම් වැනි සිදුවීම් මෙහි අංගයන් වී ඇත. මෙහිදී ඉලක්ක කරනු ලැබූ මාධ්‍යවේදීන් රජය කෙරෙහි විවේචනාත්මක වූවන්සේ සැලකෙන්නන් වන අතරම මහජන මුදලින් නඩත්තුවන හා රජයේ පාලනය යටතේ පවත්නා මාධ්‍යයන් කිසිඳු වරදකාරී හැඟීමකින් තොරව පාලක පක්ෂයේ ප්‍රචාරක යාන්ත්‍රණයන් (මෙහි අලුත් වර්ධනයක් වනුයේ ජනාධිපතිවරයාගෙන් සේ සැලකෙන, ඉල්ලා නොසිටි කෙටි පනිවිඩයන්ය) බවට පත්වීම වඩාත් කැපී පෙනෙයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පළමු ධුර කාලය තුළ වූ ප්‍රධාන කැළලක් සේ සැලකෙන්නේ මාධ්‍ය නිදහස වෙත වූ ප්‍රහාරයන්ය. එබැවින් ඔහු විසින් විශාල බහුතරයකින් යුතුව ජයග්‍රහණය කරනු ලැබූ දෙවන ධුර කාලයේදී ප්‍රමුඛතාවයෙන් යුතු කරුණක් සේ මේ පිලිබඳව කටයුතු කිරීමේ වගකීමක් ඔහු වෙත පවතී.

ජනාධිපතිවරයා ජයග්‍රාහී ලෙස නැවත තෝරාගනු ලැබීමේදී පශ්චාත් යුධ ප්‍රතිනිර්මාණය, ජාතික සමගිසංධානය සහ ආර්ථික සංවර්ධනය සඳහා වු වරමක් ද ඔහු වෙත පැවරේ. මේ සියල්ල සඳහා වන අත්‍යවශ්‍ය පසුබිම සැකසෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල රජය පිළිබඳව වන වටිනාකම් කෙරෙහීවන ඔහුගේ කැපවීම සහ නීතියේ ආදිපත්‍යය සහ අනෙකුත් ප්‍රජාතාන්ත්‍රික මූලධර්මයන් විසින් ඔහුගේ බලය සහ ඔහුගේ රජයේ අධිකාරි බලය වෙත පැන වෙන සීමාවන්ට ගරු කිරීම මගිනි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන බවට සහතික කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා නීතියේ ආධිපත්‍යයට ගරු කරනු ලැබීම, මූලික මිනිස් අයිතිවාසිකම් තහවුරු කරනු ලැබීම, දේශපාලන පීඩා කිරීම් සහ පලිගැනීම් සඳහා වන පෙළඹවීම්වලට දැඩි ලෙස එරෙහිවීම ජනාධිපතිවරයාගේ යහපත පිණිස මෙන්ම ඔහුගේ රාජ්‍ය පාලනයෙහි සුජාතභාවය හා අපගේ පශ්චාත් යුද අනාගතයේ යහපත පිණිස ද හේතුවනු ඇත.

###

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ( CPA ) පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකාවේ යහපාලනය සහ ගැටුම් පරිවර්තනය සඳහා ආයතන ශක්තිමත් කිරීමේ සහ හැකියා වර්ධනයේ හදිසි අවශ්‍යතාවයක් පවතින බව හා පක්ෂවාදීත්වයෙන් තොර සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම ක්‍රියාදාමය වෙත සිදුකළ යුතු වැදගත් සහ සංවර්ධනාත්මක දායකත්වයක් පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙනය. රාජ්‍ය ප්‍රතිපත්ති විෂයයෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින් අපේක්ෂා කරනු ලබන කාර්යභාරය පූර්ව ක්‍රියාකාරී සහ මැදිහත් කාරක එකක්වන අතර හිංසාවෙන් තොර ගැටුම් නිරාකරණය සහ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යකරණය සඳහා වන ප්‍රතිපත්ති විකල්පයන් ව්‍යාප්ත කිරීම සහ ඒවා වෙනුවෙන් බලපෑම් කිරීම අරමුණු කොට ගත්තකි. ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් හට බලපෑම් කරනු ලබන ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගන්නා සහ සංවර්ධනය කරන, ප්‍රධාන පර්යේෂණ සංඝටකයක් ද අයත් වේ.

වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර http://www.cpalanka.org වෙබ් අඩවියට පිවිසෙන්න.